# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1813/21 – 2013 ජුනි 06 වැනි බ්‍රහස්පතින්දා – 2013.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/03/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

එක් පාර්ශ්වයක් වශයෙන්

කේ. පී. වික්‍රමනායක මයා, සෝමරත්න කඩේ බාරේ. පොල්ගහවෙල පාර, පානකාව, කෑගල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

කැළණි කේබල්ස් ලිමිටඩ්, අංක 14, වේවැල්දූව, කැළණිය.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

බොරලැස්ගමුව, එගොඩවත්ත, පළමු පටුමග, අංක 213 හි එස්. එම්. එස්. ජයවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2013 මැයි මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/03/2012.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත
## (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

එක් පාර්ශ්වයක් වශයෙන්

කේ. පී. වික්‍රමනායක මයා, සෝමරත්න කඩේ බාරේ. පොල්ගහවෙල පාර, පානකාව, කෑගල්ල.

සහ

අනෙක් පාර්ශ්වය වශයෙන්

කැළණි කේබල්ස් ලිමිටඩ්, අංක 14, වේවැල්දූව, කැළණිය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,**

1988.11.25 දින සිට කැළණි කේබල්ස් ලිමිටඩ් ආයතනයේ වෑද්දුම්කරුවෙකු ලෙස සේවය කර ඇති කේ. පී. වික්‍රමනායක මහතාගේ සේවය 2005.11.23 දින තහනම් කිරීම තුළින් හා 2006.10.19 දින විනය පරීක්ෂණයක් පවත්වා 2005.11.24 දිනයෙන් වලංගු වන පරිදි සේවයෙන් පහ කිරීම යුක්ති සහගත වන්නේද? එසේ නොවන්නේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද? යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2013 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

06 – 494

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.